# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.
දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045
වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


2025.03.02 මාධ්‍ය නිවේදන අංක: 2025/017/R

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>රු. 30,000/- ක (රුපියල් තිස්දහසක) මුදලක් අල්ලස් වශයෙන් ඉල්ලීම සහ එයට අනුබල දීම යන චෝදනා මත උප පොලිස් පරීක්ෂකවරයෙකු සහ පොලිස් කොස්තාපල්වරයෙකු අල්ලස් චෝදනා මත අත්අඩංගුවට</u>**

ගල්නෑව ප්‍රදේශයේ පුද්ගලයෙකු විසින් කරන ලද පැමිණිල්ලකට අනුව, පැමිණිලිකරු මිල දී ගන්නා ලද ගොයම් කපන යන්ත්‍රය (සුනාමි) මිල දී ගන්නා ලද පුද්ගලයාගේ නොවන බව පවසා එයට එරෙහිව නීති මඟින් කටයුතු නොකර සමථයක් කර, එම යන්ත්‍රය මිල දී ගත් මුදල නැවත ලබා ගැනීමට අවශ්‍යය කටයුතු කර දීමටත් පරණ යකඩ ව්‍යාපාරය කරදරයකින් තොරව ඉදිරියට කර ගෙන යාමට අවස්ථාව සලසා දීම සඳහා රු.30,000/- ක අල්ලස් මුදලක් තුටු පඬුරක් ලෙස ඉල්ලීම සහ එම මුදල තුටු පඬුරක් ලෙස ඉල්ලීමට ආධාර අනුබල දීම හා එම මුදල් ලබා ගැනීමට සහාය වීම යන අල්ලස් චෝදනා මත ගල්නෑව පොලිස් ස්ථානයේ උප පොලිස් පරීක්ෂකවරයෙකු සහ පොලිස් කොස්තාපල්වරයෙකු 2025.03.01 වන දින පෙ.ව.11.55 ට සහ පෙ.ව.11.58 පමණ ගල්නෑව පොලිස්ථානයේ ආසන්නයේ ප්‍රධාන මාර්ගයේ දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදී.

අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2025.03.07 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලදි.

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය**
0112502672